# රිදී විහාරයේ ආගමික නිර්මාණ පිළිබඳ විමර්ශනයක්

වටරක්ගොඩ සුමන හිමි[1], රිදීගම වනරතන හිමි[2]

## හැඳින්වීම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිල්ල හත්පත්තුවේ මාදුරේ කෝරළේ රිදීගම ග්‍රාමයේ රිදී විහාරය පිහිටා තිබේ. මූලාශ්‍රයන්ට අනුව මෙම විහාරය සෘජුවම අනුරාධපුර, පොළොන්නරු සහ මහනුවර යන යුග ත්‍රිත්වයට අයත් සාධකයන්ගෙන් සමන්විතය. ගල් ලෙන් විසිපහක් දක්නට ලැබෙන මෙහි ලෙන් අටක පමණ බ්‍රාහ්මීය අක්ෂර සහිත සෙල් ලිපි දක්නට ලැබේ. මහාවංසයේ 'මහාථූපසාධනලාභ' නම් විසිඅට වන පරිච්ඡේදයේ රිදී විහාරයේ ආරම්භය සම්බන්ධ තොරතුරු ඇතුළත්ව තිබේ. ඊට අමතරව මහාවංසයේ පස්වන කොටස ලේඛනගත කිරීම සිදුකළ රිදී විහාරයේ වැඩසිටි තිබ්බටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමියන් කීර්ති ශ්‍රී වික්‍රමසිංහ රජ දවස රිදී විහාරයේ සිදුකරන ලද ඉදිකිරීම් පිළිබඳ මනා විස්තරයක් එයට ඇතුළත් කොට තිබේ. රිදී විහාරය සම්බන්ධ පරිපූර්ණ විස්තරයක් රිදී විහාර අස්නය කෘතියේ අන්තර්ගතය. චිත්‍ර, මූර්ති, කැටයම්, සෙල්ලිපි සහිත රිදී විහාරය ඓතිහාසිකමය කාරණාවන්ගෙන් අනූන ස්ථානයකි.

## පර්යේෂණ ක්‍රමවේදය

මහාවංසය, රිදී විහාර අස්න සහ පුරාවිද්‍යාත්මක වශයෙන් විද්‍යමාන වන මූලාශ්‍රයන් භාවිත කරමින් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම පරීක්ෂණය සිදු කෙරේ.

## ප්‍රතිඵල

කාලපරාසයන් ත්‍රිත්වයක ආගමික සංකලනය, රිදී විහාරයේ වර්තමානය දක්වා කුමන ආකාරයකින් ඉතිරිව පවතින්නේද යන වග මෙමඟින් තහවුරු කරගැනීමට හැකිවනු ඇත. එසේම විවිධ ආගමික අනන්‍යතාවන් එකම විහාරස්ථානයක් තුළ දක්නට ලැබෙන ආකාරය පිළිබඳව මනා අවබෝධයක් ලැබීමටද හැකි වේ. විශේෂයෙන්ම ක්‍රිස්තු ආගමික සංකේත මෙහි දක්නට ලැබෙන්නේ කුමන කාරණා පදනම් කරගෙනද යන්න පිළිබඳවත් සාධක සහිත අනාවරණයක් මෙමගින් සිදුකෙරේ.

---

[1] ආධුනික කථිකාචාර්ය, භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, watarakgodasumana@gmail.com
[2] සහාය කථිකාචාර්ය, භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, revridigama@gmail.com

සාකච්ඡාව

රිදී විහාරයේ බෞද්ධාගමික නිර්මාණ ප්‍රධාන වශයෙන්ම දක්නට ලැබෙන්නේ මහාවිහාරය හෙවත් පහත විහාරය යනුවෙන් දැනට හඳුන්වනු ලබන ගල් ලෙනේත් එයට මඳක් ඉහළින් පිහිටා ඇති උඩ විහාරය නමින් හඳුන්වන ගල් ලෙනේත් සහ වරකා වැළඳූ විහාරය නමින් හඳුන්වන ලෙනේත්ය. පහත විහාරයේ ගල් ලෙනෙහි කටාරම්වලට මඳක් පහතින් විනාශවෙමින් පවතින චිත්‍ර සටහන් කිහිපයක් දැකගත හැකිය. එහි පැහැදිලිව පෙනෙන්නට තිබෙන ප්‍රධාන සිතුවමේ එය නිර්මාණය කිරීම සඳහා භාවිත කරන ලද කටු සටහන දක්නට ලැබේ. ලෙන අභ්‍යන්තරයේ ගුහා ගල්තලය මත අතරක් නොතබා සිතුවම් ඇඳ තිබේ. සියලුම සිතුවම් මහනුවර යුගය නියෝජනය කරයි. මාර යුද්ධය නිරූපණය කරන සිතුවම සුවිශේෂීය. බුදුන් අසුනක වැඩසිටින ස්වරූපය පෙන්වන සියගණනක් එක හා සමාන සිතුවම් සිය ගණනක් දක්නට ලැබේ. මහාවංසයේ මෙම සිතුවම් 'ඇතුළු බිත හොබනා දහසක් බුදු රූ' යනුවෙන් දක්වා ඇත. නුවර ගංගාරාම විහාරයේ ද මෙබඳුම සිතුවම් දක්නට ලැබේ. මෙමගින් බුදුන් වහන්සේගේ රූප මවාගැනීමේ හැකියාව පෙන්නුම් කෙරෙන බව මහාචාර්ය සෝමතිලකගේ අදහස වේ.

උඩ විහාරයේ සිතුවම්වලින් බුදු සිරිතත් ලංකාවේ බෞද්ධාගමික සිද්ධස්ථාන නිරූපණයත් සිදු කොට තිබේ. සූවිසි විවරණ ලැබීම, සත්සතිය, අටවිසි බුද්ධරූප, සොළොස්මස්ථාන, රාම-රාවණා යුද්ධයේ අවස්ථා, සත්ව සැරසිලි ආදිය මෙම විහාරයේ සිත්තම් කොට තිබේ. සත්සතිය චිත්‍ර අතුරින් දෙවන සතිය නිරූපණය කරන සිතුවම සුවිශේෂීතාවක් උසුලයි. එහි දී බුදුරුව නිරූපණය කොට ඇත්තේ පද්මයක් මත වැඩසිටිමින් දෑත් පපුව මත තබාගෙන බෝධිය දෙස බලාසිටින ආකාරයෙනි. මෙම සිතුවමේ නිරූපිත මුද්‍රාව පොළොන්නරුවේ ගල් විහාරයේ තිබෙන හිටි පිළිමයේ මුද්‍රාවට සමානය. එම පිළිමය බුදුන් පිරිණිවීමෙන් ශෝකයට පත් ආනන්ද හිමියන්ගේය යනුවෙන් පරණවිතාන විසින් ඉදිරිපත් කොට ඇති මතය, තර්කයට බඳුන් කිරීමට රිදී විහාර සිතුවම භාවිත කළ හැකිය.

ශ්‍රී පාදය නිරූපණය කරන සිතුවමේ ද විශේෂත්වයක් දක්නට ලැබේ. එනම් එය තිර රෙද්දකින් ආවරණය වන ලෙස දක්වා තිබීමයි. මෙය යුරෝපා සිතුවම් ආභාසයක් ලෙස හඳුනාගත හැකිය. සොළොස්මස්ථාන දක්වන සිතුවම් අතර මහියංගණ දාගැබ නිරූපණයේ සුවිශේෂීත්වයක් දක්නට ලැබේ. මහියංගණ දාගැබ අවස්ථා හතරකදී විශාල කොට සාදන ලද බව දැක්වෙන මහාවංස තොරතුරට අනුව එම චෛත්‍යයේ ක්‍රමික විකාසනය දැක්වෙන ආකාරයෙන් සිතුවම ඇඳ තිබේ. මෙම ලෙනෙහිම ප්‍රධාන බුදුරුව නිර්මාණය කොට ඇති ආසනයට පහළින් වම් පසට වන්නට සැරසිල්ලක් කටින් ගත් සිංහ රූපයක් සහ

ත්‍රිසිංහ රූපයක් දක්නට ලැබේ. එම ආසනයේම අනෙක් පස වෘෂභ කුඤ්ජරය නමින් හඳුන්වන ගවයා සහ ඇතා ඒකාබද්ධ කොට තනන ලද සිතුවමක් දක්නට ලැබේ. මෙම ආසනයේම යට තට්ටුවෙහි තවත් සුවිශේෂී සිතුවම් තුනක් දක්නට ලැබේ. එය රාවණ යුද්ධය නමින් ඇතමෙක් හැඳින්වුව ද ඒ කවර කරුණු පදනම් කරගෙනදැයි යන්න විවාදාපන්නය. නිරූපිත සටන් අවස්ථා ත්‍රිත්වයේදීම අවි දරාගත් අත් සතරක් ඇති කාල වර්ණ පුද්ගලයෙකු මැදි කරගනිමින් පලිහ සහ කඩු අතින් දරාගත් සුදු පැහැති පුද්ගලයන් දෙදෙනෙක් මෙම සිතුවමේ නිරූපිතය. වරකා වැළඳූ විහාරය නමින් හඳුන්වන ගල් කුටියේ ද මහනුවර සම්ප්‍රදායේ සිතුවම් දක්නට ලැබුණත් එහි විශේෂිත සිතුවම් කිසිවක් දක්නට නැත. මහනුවර යුගයට අයත් සිතුවමින් අලංකාර අනෙකුත් විහාරයන්ට සාපේක්ෂව රිදී විහාරයේ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ ජාතක කථා නිරූපණය කරන කිසිදු සිතුවමක් දක්නට නොලැබීමයි.

රිදී විහාරයේ ප්‍රතිමා ද නුවර යුගයේ ශෛලීගත සම්ප්‍රදායම නියෝජනය කරයි. ලංකාවේ දැනට දක්නට ලැබෙන තනි රනින් කරවන ලද හිටි පිළිමයක් මෙම විහාරය තුළ දක්නට ලැබේ. ජනප්‍රවාදයන්ට අනුව එහි ඉතිහාසය දුටුගැමුණු රජ සමය දක්වා ගමන් කළත් නිර්මාණ ලක්ෂණ අනුව නම් එය අයත් වන්නේ මහනුවර යුගයටමය. මෙහි දක්නට ලැබෙන විශාලතම ප්‍රතිමාව වන්නේ දහ අට රියන් ඔත් පිළිමයයි. එම පිළිමයේ හිස දෙසින් වීරාසන මුද්‍රාවෙන් නිරූපිත හිඳි පිළිමයකි. ඔත් පිළිමයේ පා පසින් තවත් පිළිම කිහිපයක් දක්නට ලැබේ. සමීපයෙන්ම ඇති පිළිමයෙන් බුදු රදුන්ගේ උපස්ථායක ආනන්ද හිමියන් නිරූපණය කෙරේ. මෛත්‍රී බෝසත් ප්‍රතිමාවක් අනතුරුව දක්නට ලැබෙන අතර ක්‍රමයෙන් නෂ්ට වෙමින් යන දේවරූප කිහිපයක් පෙළට ඇත. මින් කෙළවරේම ඇති රූපය යම් ආකාරයක විශේෂත්වයක් ගනී. මෙම විහාරයේ දුටුගැමුණු ප්‍රතිමාවක් ඉදි කළ බව මහාවංසයේ දක්වා තිබීමත් දේව රූප ලක්ෂණයන්ට වෙනස් ස්වරූපයක් දක්නට ලැබීමත් පදනම් කොටගෙන මෙය දුටුගැමුණු රජුගේ පිළිමයම බව හඳුනාගත හැකිය. ඊළගට එක සමාන මුද්‍රාවන්ගෙන් සහ එක සමාන උසින් යුත් බුද්ධ ප්‍රතිමා පහක් පමණ දක්නට ලැබේ. මේවා ස්වර්ණාලේපිත කළ බව මහාවංසයේ සඳහන් වේ.

උඩ විහාරයේ දක්නට ලැබෙන රියන් දොළහක් පමණ උස වීරාසන ස්වරූපයෙන් නිර්මිත සමාධි මුද්‍රා ප්‍රතිමාව, මකර තොරණක් සහිතව නෙළා ඇති ලංකාවේ දක්නට ලැබෙන දුර්ලභම ප්‍රතිමාව වේ. සාමාන්‍යයෙන් විහාර දොරටු අසළ දක්නට ලැබෙන මකර තොරණෙහි මකරාගේ මුඛය දොරටුවට ඉහළින් නිමවා තිබුණද මෙහි මකර මුඛ දෙකක් ප්‍රතිමුඛව විවර කරගත් මුඛ ඇතිව බුදු

පිළිමයේ උරහිස් දෙකට සමාන්තරව නෙළා තිබේ. දේවරූපවලින් අලංකාර කොට ඇති මෙහි දක්නට ලැබෙන තවත් විශේෂ ස්වරූපයක් වන්නේ එයට කාන්තා රූප ඇතුළත් කර තිබීමයි. එය ලංකාවේ කිසිදු මකර තොරණක දක්නට නොලැබෙන අංගයකි. මහා විහාරයත් උඩ විහාරයත් අතර ඇති උලුවස්ස ඇත්දත් කැටයමින් අලංකාර කොට තිබේ. මෙය සම්පූර්ණයෙන්ම ඇත්දත් කැටයමින් සරසා තිබූ බවට සාධක තිබුණත් වර්තමානය වන විට එහි ඇත්තේ කොටසක් පමණි. එම කොටස තුළ පංචනාරි ඝටය, ඉදිරියට පැනීම සඳහා සූදානමින් සිටින සිංහ රූප දෙකක් සහ නාටිකාංගනාවකගේ රූපයක් දක්නට ලැබේ.

බෞද්ධාගමික සංකේතයන්ට අමතරව රිදී විහාරයෙන් හමුවන සුවිශේෂී නිර්මාණයක් වන්නේ පහත විහාරයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාව ඉදිරිපස දක්නට ලැබෙන මල් ආසනයයි. ලංකාවේ කිසිදු විහාරයක දක්නට නොලැබෙන ක්‍රිස්තියානි ආගමික සටහන් මෙම මල් ආසනයේ දක්නට ලැබේ. ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධ සිදුවීම් ඇතුළත් පිගන් ගඩොල් හැට අටක් පමණ මෙහි අතුරා ඇත. එහෙත් ඒවායේ ක්‍රමවත් බවක් දක්නට නැත. ඉන් ගම්‍ය වන්නේ මෙම ගඩොළු ඇතිරූ නිර්මාණ ශිල්පියාට ක්‍රිස්තු චරිතය පිළිබඳව අවබෝධයක් නොතිබූ බවයි. නැතහොත් හිතාමතාම අක්‍රමවත් ලෙස ඒවා ඇතිරීම සිදු කොට ඇතිබවයි. කෙසේ නමුත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ හැකි ක්‍රිස්තු චරිතාපදාන සටහන් මෙහි ඇතුළත්ව තිබේ. රිදී විහාර අස්නේ දැක්වෙන්නේ පැල්ප් නමැති ලන්දේසි ආණ්ඩුකාරවරයෙකු විසින් විහාරස්ථානය වෙත ලබාදුන් බවයි.

රිදී විහාරයෙන් හින්දු කලා ආභාසය ලද නිර්මාණයක්ද හමුවේ. එනම් වරකා වැළඳූ විහාරය ලෙස වර්තමානයේ හඳුන්වන ශෛලමය ගුහා නිර්මාණයයි. මහාවංසයේ අම්බට්ඨකෝල ගුහාව ලෙස සඳහන් කරන්නේ මෙම ලෙන විය හැකිය. පල්ලව සම්ප්‍රදායට අනුව නිර්මාණය කොට ඇති මෙහි ගල් ගුහාවට මුලින් මණ්ඩපයක් දක්නට ලැබේ. එය චතුරස්‍රාකාර ගල් කණු අටකින් යුක්තය. මෙම ගල් කණු පාමුල අලංකාර කැටයම් දැකගත හැකිය. ලංකාවේ කිසිදු බෞද්ධ විහාරයකින් හමුනොවන නාට්‍යාංගනාවන්ගේ රූපයන්ගෙන් එම කැටයම් සමන්විත වේ. භාරතීය හින්දු දේවාලයන්හි සුලභව හමුවන මෙම කැටයම් පදනම් කරගනිමින් සහ නිර්මාණ ලක්ෂණ අනුව මෙය හින්දු දේවාලයක් බව තීරණය කළ හැකිය. මහනුවර යුගයේදී මෙම විහාරයේ සිදු කළ නවකම් සියල්ල සඳහන් කොට ඇති බැවිනුත් අනුරාධපුර යුගයේදී මෙබන්දක් සෑදූ බවට සාධක නොමැති හෙයිනුත් ලංකාවේ ද්‍රවිඩ බලපෑම ප්‍රබලව තිබූ පොළොන්නරු යුගයේ දී නිර්මාණය කළ බව සැලකීම යුක්ති යුක්තය.

## නිගමනය

මෙම තොරතුරු අධ්‍යයනය හමුවේ නිගමනය කළ හැක්කේ බෞද්ධ, හින්දු සහ ක්‍රිස්තියානි යන ආගම් ත්‍රිත්වයටම අයත් සංකේත රිදී විහාරයෙන් හමුවන බවයි. මේ ආකාරයට ප්‍රධාන ආගම් තුනක ලක්ෂණ හමුවන ලංකාවේ එකම විහාරස්ථානය ලෙසද රිදී විහාරය හඳුනාගත හැකිය. විශේෂයෙන් ක්‍රිස්තු චරිතය පිළිබඳ තොරතුරු දිගහැරෙන පිගන් ගඩොළු හැට අට රිදී විහාරයේ සුවිශේෂීම අංගය ලෙස හඳුනාගත හැකිය. එපමණක්ම නොවේ, කිසිදු ජාතක කථාවක් නිරූපණය නොකරන මහනුවර යුගයේ සිතුවම් අන්තර්ගත විහාරයක් ලෙසද විශේෂත්වයට පත්වේ.

ප්‍රමුඛ පද : රිදී විහාරය, චිත්‍ර, මහනුවර, හින්දු

## ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංශය.* (2007). (සංස්.). ආනන්ද ඩබ්ලියු. පී. ගුරුගෙ. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*රිදී විහාර සන්නස,* රිදී විහාරය.

සෝමතිලක, මහින්ද. (2005). *කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහා විහාරය.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමතිලක, මහින්ද. (2013). *මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ බිතු සිතුවම් කලාව.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.